**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - 2013**
**-----------------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය,ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**
**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණිත ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනිම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරන ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ගිණුම් ප්‍රතිපත්ති අංක 3.2.2 අනුව** වසර තුළ දරන ලද නමුත් වැඩ නිම නොකරන ලද ව්‍යාපෘතිවල ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් නොනිමි ප්‍රාග්ධන ශේෂයක් ලෙස හඳුනාගන්නා බව දැක්වුවද, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සියයට 20 ක නිමැවුම් ප්‍රගතියක් පැවති රු.මිලියන 212.25 ක වියදමක් දරා ඇති සී - සිටි ගොඩනැගිල්ල දේපළ පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ආ) **ගිණුම් ප්‍රතිපත්ති අංක 3.3.1.9 අනුව** වෙළඳ සහ අනෙකුත් ණයගැතියන් වෙනුවෙන් එක් එක් ණයගැතියන්ගේ ණය අයකර ගැනීමේ හැකියාව වෙන් වෙන්ව ඇගයීමකට භාජනය කර අපහායන කළයුතු ප්‍රමාණය තීරණය කරන බව දැක්වුවද, ඊට පටහැනිව සමස්ථ ණයගැතියන් වෙනුවෙන් රු.මිලියන 500.68 ක සාමාන්‍ය බොල් ණය වෙන්කිරීමක් ( General Provision) සිදුකර තිබුණි.

(ඇ) **ගිණුම් ප්‍රතිපත්ති අංක 3.2.4 අනුව** තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකමින් අඩු අගයට ගණනය කරන බව දක්වා තිබුනද, සංස්ථාව විසින් 2013 දෙසැම්බර් 31 දිනට පැවති නිමි ද්‍රව්‍ය තොග සහ අමුද්‍රව්‍ය තොග අගය කිරීමේදී ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමකින් තොරව පිරිවැය අගය මත පමණක් පදනම්ව තොග වටිනාකම ආගණනය කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වූ ණයගැති ශේෂයේ රු. 496,541,127 ක් වටිනා අසාමාන්‍ය බැර ශේෂයක් වුයෙන් එදිනට ණයගැති වටිනාකම රු. 496,541,127 කින් ඌනගණනය වී තිබුණි.

(ආ) සංස්ථාවේ එක් එක් අංශයන් අතර අන්තර් දෙපාර්තමේන්තු ජංගම ගිණුම් ශේෂයන් වර්ෂය අවසානයේ එකිනෙක ගැලපිය යුතු වුවත් ඒවා නිවැරදිව සැසඳුම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 96,088,486 ක අන්තර් දෙපාර්තමේන්තු ජංගම ගිණුම් හර ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සංස්ථාවට අයිතිය පවරා නොගත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් පර්චස් 799 ක් රු. 79,615,000 කට අගය කර ගිණුම්වලට ගෙන තිබුණි. මෙම ඉඩම් ජාතික නිවාස

සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලද වත්කමක් ලෙස පෙන්නුම්කර තිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 702.31ක් වූ රාජ්‍ය ප්‍රදාන ලැබීම් මූල්‍ය ප්‍රකාශනවල හිමිකම් යටතේ පෙන්නුම් කලයුතු වුවද එම වටිනාකමෙන් රු.මිලියන 555.18 ක් ජංගම නොවන වගකීම් යටතේද ඉතිරි රු. මිලියන 147.13 ක් ජංගම වගකීම් යටතේද දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ වගකීම් ගිණුම්වල රු.මිලියන 393.03 ක අසාමාන්‍ය හර ශේෂයන් මෙන්ම වත්කම් ගිණුම්වල රු.මිලියන 67.74 ක අසාමාන්‍ය බැර ශේෂයන් නිරීක්ෂණය වූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති 2013 දෙසැම්බර් 31 දිනට වූ ජංගම බැරකම් සහ ජංගම වත්කම් පිළිවෙලින් එම වටිනාකම් වලින් ඌනගණනය වී තිබුණි.

(ඊ) සී-සිටි ව්‍යාපෘතියේ ප්‍රචාරණ හා වෙනත් වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.මිලියන 17.63 ක් එම ව්‍යාපෘතියේ වියදමක් ලෙස දක්වනවා වෙනුවට සංස්ථාවේ ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(උ) 2012 වර්ෂයේදී විලම්බිත බදු ගණනය කිරීමේදී රු.මිලියන 278.68 ක ස්ථාවර වත්කම් වල ලියාහල අගය නොසලකා හැරීම හේතුවෙන් විලම්බිත බදු වත්කම් ගිණුම රු.මිලියන 33.44 ක් වැඩියෙන් දක්වා තිබීමේ වරද සමාලෝචිත වර්ෂයේදී අතීතානුයෝගීව නිවැරදි කර නොතිබීම මත පූර්ව වර්ෂ ලාභය රු.මිලියන 33.44 කින් අධිගණනය වී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන්ම ඌනගණනය වී තිබුණි.

(ඌ) 2012 වර්ෂයේදී ගෙවන ලද උපකොන්ත්‍රාත් වියදම් පාලන ගිණුමක ඇතුළත්ව තිබුණු රු.මිලියන 21.26 ක වියදම් එම වර්ෂයේ ආදායම් ප්‍රකාශයට මාරු නොකර ජංගම වත්කමක් ලෙස ගණනය කර තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි. ඒ හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට වූ රඳවාගත් ආදායම එම වටිනකාමින්ම ඌනගණනය වී තිබුණි.

(එ) 2010 වර්ෂයේ කරන ලද සේවා සැපයුමක් මත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් සංස්ථාවට අයකර ගතයුතු රු.මිලියන 168.99 ක එකතුකල අගය මත බදු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය එකතුකල අගය මත බදු වලින් නිදහස් කිරීම හේතුවෙන් ගෙවීමට නොහැකි බව දන්වා තිබියදීත් එම මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය කර ගැනීමට හෝ ඒ වෙනුවෙන් ප්‍රතිපාදනයක් ඇති කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) ගිණුම් තැබීමේ දෝෂයක් හේතුවෙන් 2011 වර්ෂයේ සිට ආපසු අයවියයුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්කරන රු.මිලියන 13.54 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු ගිණුමේ හර ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කිසිඳු ගැලපීමක් නොකර එලෙසම පැවතුණි.

### 2.2.3 මූල්‍ය ප්‍රකාශනවල කරන ලද අසාමාන්‍ය ගැලපීම්

2012 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 100.60 ක ධාරණ අගයක් සහිත යන්ත්‍ර හා පිරියත සහ මෝටර් වාහන එදිනට රු.මිලියන 477.10 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර 2013 ජනවාරි 01 දින එම වත්කම් රු.මිලියන 240.70 ක් ලෙස නැවත ප්‍රත්‍යාගණනය කර තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකල වෙනස්කම් හා නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් 09ක ශේෂයන් හා ඊට අදාල උපලේඛනවල සඳහන් ශේෂයන් සමග සසඳා නොතිබුණු අතර ඒ දෙක අතර රු.මිලියන 732.23 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් රු.මිලියන 242.82 ක් වටිනා ගිණුම් විෂයයන් වලට අදාලව ඒ එක් එක් අයිතමය ඉදිරියෙන් දැක්වෙන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | ගිණුම් විෂයය | වටිනාකම<br>රු.මිලියන | නොසැපයු සාක්ෂි |
|---|---|---|---|
| (අ) | නාරාහේන්පිට පෙරසවි අංගනය වෙනත් ස්ථානයකට ගෙනයෑමෙන් වූ මුලධන ලැබීම. | 22.65 | ලැබීම් ප්‍රභවය සහ පැවරුම් ලේඛන ඇතුලත් ලිපිගොනු |
| (ආ) | මුදල් හා මුදල් සමාන දෑ තුළ ඇතුළත් අංක 9934 ගිණුමේ ශේෂය | 1.88 | බැංකු ප්‍රකාශන, බැංකු සැසඳුම්, ශේෂ තහවුරු කිරීම් |
| (ඇ) | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථා (කටාර්) සමාගමේ මුදල් ශේෂ | 5.95 | බැංකු සනාථ කිරීම්, බැංකු ප්‍රකාශන, බැංකු සැසඳුම්, බැර උපදෙස් පත්‍ර |
| (ඈ) | රඳවා ගැනීම් මුදල් (යන්ත්‍රෝපකරණ අංශය) | 19.77 | උපලේඛන, කාල විශ්ලේෂන |
| (ඉ) | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් - යන්ත්‍රෝපකරණ අංශය | 20.33 | - එම - |
| (ඊ) | විලම්බිත බදු සඳහා වූ තාවකාලික වෙනස (දේපළ,පිරියත හා උපකරණ) | 172.24 | උපලේඛන,ගණනය කිරීම් |
| | | 242.82 | |

### 2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු. මිලියන 4,655.6 ක වෙළඳ ණයගැති ශේෂයෙන් සියයට 95 කට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතුව තිබූ අතර ඉන් රු. මිලියන 1,959.8 ක් වර්ෂ 03 කට වඩා කල් ඉක්මවූ ශේෂ විය.

(ආ) ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් 2011 වසෙර් සිට ලැබිය යුතු රු.මිලියන 1,133.82 ක් 2014 දෙසැම්බර් 31 දින දක්වා ද අයවී නොතිබුණු අතර ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව උක්ත ව්‍යාපෘති වෙනුවෙන් සංස්ථාවට ගෙවිය යුතු වටිනාකම රු. මිලියන 568.62 ක් වූයෙන් ඒ අතර රු. මිලියන 565.20 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2000 වර්ෂයේ සිට සංස්ථාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු රු. මිලියන 20.56 ක් සහ අධිකාරියෙන් අයවිය යුතු රු. මිලියන 5.36 ක මුදලක් දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතියද, එම මුදල් ගෙවීමට හෝ අයකර ගැනීමට කිසිඳු ඵලදායී ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) සේරුවිල වැඩබිමේ මුදල් භාරකරු විසින් සිදුකරන ලද මූල්‍ය වංචාවට අදාලව ඔහුගෙන් අයවිය යුතු රු.805,938 ක මුදල 2008 වර්ෂයේ සිට මේ දක්වා ගිණුම්වල දක්වා ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) 2010 වර්ෂය තුළ සහ ඊට පෙර වර්ෂයන්හිදී ලබාගත් රු.මිලියන 1,088 ක වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් නොවෙනස්ව පැවතුණි.

(ඊ) 2012 වර්ෂය අවසානයට උපදේශන අංශයේ උපචිත වියදම් වෙනුවෙන් වෙන්කළ රු.මිලියන 125.46 ක මුදලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොපියවන ලද ශේෂය රු.මිලියන 124.89 ක් විය.

(උ) 2011 වර්ෂයේ සිට ගෙවිය යුතු බදු ලෙස දක්වා තිබූ රු. මිලියන 637.27 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ද නිරවුල් නොවී තිබුණි.

(ඌ) 2011 වර්ෂයේ සිට වැඩබිම් 58 ක උපකොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් ගෙවිය යුතුව ඇති රු.මිලියන 9.61 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොවී තිබුණි.

(එ) 2010 වර්ෂයේ සිට රු.මිලියන 131.8 ක සමුච්චිත පිරිවැයක් දරා තිබුණු ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති 18 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන්වොයිස් ඉදිරිපත් කර මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි හා කලමනාකරණ තීරණයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත 14(1) වන වගන්තිය | සංස්ථාව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 134 (3) | අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතවරයා වෙත එවා නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 396 | නිකුත් කර මාස 06 කට වැඩි කල් ඉකුත්වූ රු. 12,666,531 ක් වටිනා චෙක්පත් 19 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/පීඊඑන්/2011/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>• ඡේද අංක 01 | සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව සිය අරමුණු වලට පටහැනිව රු.මිලියන 21.36 ක ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම් දරා තිබුණි. |
| | • ඡේද අංක 02 | සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත වාර්ෂික ප්‍රචාරණ වැඩසටහනක් සංස්ථාවට නොතිබුණි. |
| (ඈ) | 2013 දෙසැම්බර් 09 දිනැති අංක 01/2013 (i) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට පටහැනිව සංස්ථාවේ සේවකයන්ට ප්‍රසාද දීමනාව රු.15,950,500 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |
| (ඉ) | 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමණාකරණ චක්‍රලේඛයේ 1 වන වගන්තිය | වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා ඉංජිනේරු, ගෘහනිර්මාණ ශිල්පී, ප්‍රමාණ සමික්ෂක යන සේවා වර්ගීකරණයට අයත් තනතුරු දරන සේවකයන්ට රු. මිලියන 158.67 ක් දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. |
| (ඊ) | (i) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛයේ 4.2.1 ඡේදය | සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (උ) | 2006 අගෝස්තු 01 දිනැති අංක 28(II) දරන කළමණාකරණ සේවා චක්‍රලේඛය සහ 2009 නොවැම්බර් 25 දිනැති අංක ඩීඑම්එස් /ඊ 3/43/4/265/1 දරන කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු ඇතිකිරීම හෝ පුරප්පාඩු පිරවීම සිදුනොකළ යුතු බවට දැනුම්දී තිබියදීත් අනුමත නොවූ තනතුරු 32 ක් ඇතිකර ඒ සඳහා සේවකයින් 197 ක් බඳවාගෙන තිබුණි. |
| (ඌ) | 2011 පෙබරවාරි 14 දිනැති අංක ඩීඑම්එස්/ඊ3/43/4/265/1 දරන කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය | සමාලෝචිත වර්ෂය සඳහා අනුමත ස්ථිර නුපුහුණු සේවක සංඛ්‍යාව 460 ක් වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවයේ යෙදුණු තථ්‍ය සේවක සංඛ්‍යාව 706 ක් විය. |
| (එ) | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2004 අප්‍රේල් 28 දිනැති අංක බීඩී/356/303/23 එන් දරන ලිපිය | ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු මුදල් |

වලින් වන්දි ගෙවා ඉතිරි වී තිබුණු රු. 20,278,812 ක මුදල් ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාද ආපසු යවා නොතිබුණි.

3. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම්වල ප්‍රතිඵලය බදුවලට පෙර රු.මිලියන 148.57 ක ශුද්ධ ලාභයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදුවලට පෙර ශුද්ධ ලාභය රු.මිලියන 225.91 ක් විය. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ශුද්ධ ලාභයෙහි රු.මිලියන 77.34 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සැසැඳීමේදී විශේෂ මෙහෙයුම් අංශයේ සහ උපදේශන අංශයේ මෙහෙයුම් ලාභය පිළිවෙලින් රු.මිලියන 216 ක් සහ රු.මිලියන 30 කින් පිරිහීමත් යන්ත්‍රෝපකරණ අංශයේ රු.මිලියන 45 ක මෙහෙයුම් අලාභයත් ශුද්ධ ලාභය පිරිහිමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3.2 **විග්‍රහාත්මක සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ උපදේශන, විශේෂ මෙහෙයුම් සහ යන්ත්‍රෝපකරණ යන අංශවල ශුද්ධ මෙහෙයුම් ලාභ පිළිවෙලින් සියයට 24, සියයට 54 සහ සියයට 1,205 කින් පිරිහී තිබුණි.

(ii) 2011 වර්ෂයේ හැරුණු විට අනෙකුත් සියළුම වර්ෂයන්හි දී සංස්ථාවේ බදුවලින් පසු ශුද්ධ ලාභය අඛණ්ඩව අඩුවී තිබුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේදී බදු වලින් පසු ලාභය අඩුවීම සියයට 40 ක් විය.

(iii) සමාලෝචිත වර්ෂයේදී වැටුප්, දීමනා , කොන්ත්‍රාත් ශ්‍රමය හා ඊට සම්බන්ධ අනෙකුත් වියදම් ලෙස සංස්ථාව දැරූ වියදම රු.මිලියන 2,136.75 ක් වූ අතර එය පිරිවැටුමෙන් සියයට 27 ක් විය.

(iv) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මුළු පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස ශුද්ධ ලාභය සහ මුළු විස්තීර්ණ ආදායම පිළිවෙලින් සියයට 42 කින් සහ 102 කින් පිරිහී තිබුණි.

(v) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදි මූල්‍ය වගකීම් මූල්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 8 කින් ඉහළ ගොස් තිබුණු අතර මුළු වගකීම්, හිමිකමේ සහ මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 15 කින් සහ 3 කින් ඉහළ ගොස් තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් හා උපාංග අංශයට අයත් ඒකල, වැලිකන්ද සහ රත්මලාන වැඩබිම්වල 2012 වර්ෂයේ රු.මිලියන 41.33 ක් වූ මෙහෙයුම් ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 7.06 ක් දක්වා සියයට 83 කින් පිරිහී තිබුණි. වැඩ බිම්වල විකුණුම් පිරිවැය හැර අනෙකුත් වියදම්වල වැඩිවීම මේ සඳහා බලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ඉදිකිරීම් උපාංග අංශයට අයත් දංකොටුව ගඩොල් හා වඩු නිෂ්පාදන අංගනය රු.මිලියන 3.15 ක අලාභයක් ලබා තිබුණු අතර, පසුගිය වසර 16 අතුරින් වසර 15 කදීම මෙම අංගනය පාඩු ලබා තිබුණි. එම සමුච්චිත පාඩුව රු.මිලියන 28.9 ක් විය. වැඩ බිමේ ආදායම වැඩිවීමේ ප්‍රතිශතයට වඩා විකුණුම් පිරිවැය ඉහළයාම මෙම තත්ත්වයට බලපා තිබුණි.

(ඇ) යාන්ත්‍රික හා විදුලි අංශයට අයත් පැලියගොඩ ,රත්මලාන සහ කොළඹ වැඩබිම් 03 ක 2012 වර්ෂයේ රු.මිලියන 15.40 ක මෙහෙයුම් ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 9.87 ක් දක්වා සියයට 55 කින් පිරිහී තිබුණි. උක්ත වැඩබිම්වල විකුණුම් පිරිවැය හැර අනෙකුත් වියදම් ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ඈ) යාන්ත්‍රික හා විදුලි අංශයට අයත් මාතලේ ඩොලමයිට් පෙරසැරි අංගනයේ මෙහෙයුම් කටයුතු සමාලෝචනයේදී පසුගිය වර්ෂ 16 අතුරින් 2006 වර්ෂය හැරුණුවිට අනෙක් සියළු වර්ෂයන් අලාභ සහිතව පවත්වාගෙන ගොස් තිබුණු අතර 2012 වර්ෂයේදී රු.මිලියන 0.85 ක් වූ අලාභය සියයට 1,521 කින් වැඩිවී සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 13.78 ක අලාභයක් ලබා තිබුණි. මුළු කාලපරිච්ඡේදය තුළ ලැබූ සමුච්චිත අලාභය රු.මිලියන 52.2 ක් විය. වැඩබිමේ පිරිවැටුම අඩුවීම හා විකුණුම් පිරිවැය, අනෙකුත් වියදම් වැඩිවීම මෙම තත්ත්වය කෙරෙහි බලපා තිබුණි.

(ඉ) 2012 වර්ෂයේ සංස්ථාවේ උපදේශාත්මක සේවා අංශයේ රු.මිලියන 124.54 ක් වූ ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 94.6 ක් දක්වා සියයට 24 කින් පිරිහී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී යන්ත්‍රෝපකරණ අංශයේ ප්‍රධාන කාර්යාලය, කොලොන්නාව ප්‍රධාන ගබඩාව ඇතුළු ප්‍රාදේශීය කාර්යාල හා වැඩබිම් 15 ක් ලැබූ සමුච්චිත අලාභය රු.මිලියන 98.16 ක් විය.

(උ) යන්ත්‍රෝපකරණ අංශයේ හොරණ, දඹුල්ල,අම්පාර, කල්මුනේ සහ තමන්කඩුව ප්‍රාදේශිය කාර්යාල මෙන්ම මහියංගන වැඩබිමද සමාලෝචිත වර්ෂය තුළදී කිසිඳු ආදායමක් ලබා නොතිබුණ නමුත් මෙම වැඩබිම් සඳහා රු.මිලියන 27.89 ක වියදමක් සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණි

4.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) සමාලෝචිත වර්ෂයේදී තුළ බැංකු ඇපකර මත සංස්ථාවට ලබාගත හැකි බැංකු අයිරා පහසුකම රු.මිලියන 473.7 ක ට සීමාවී තිබුණද රු.මිලියන 555.75 ක් දක්වා අයිරා පහසුකම් ලබාගත් අවස්ථා විය. ඉන් රු.මිලියන 150 ක් තාවකාලික බැංකු අයිරාවක් (Temporary Over

Draft) ලෙස සියයට 30 ක පොලී ප්‍රතිශතයක් යටතේ ලබාගෙන තිබුණි. එබැවින් බැංකු අයිරා සඳහා සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් ගෙවන ලද මුළු බැංකු අයිරා පොලිය රු.මිලියන 77.66 ක් විය.

(ආ) සංස්ථාවේ පවතින අයහපත් ද්‍රවශීලතා තත්ත්වය මත සංස්ථාව විසින් කලින් වර්ෂවල ලබාගෙන තිබුණු රු.මිලියන 50 ක් වූ බිල් වට්ටම් කිරීමේ ණය මුදල සමාලෝචිත වර්ෂය තුළදී සියයට 19 ක පොලියක් මත රු.මිලියන 100 ක් දක්වා ඉහළ නංවා ගෙන තිබුණ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද මුළු පොලිය රු.මිලියන 21.78 ක් විය.

(ඇ) සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය සහ වැඩබිම් 08 ක් පවත්වාගෙන යන අක්කර 30 ක් පමණ වන ඉඩම් සඳහා නීත්‍යානුකුල හිමිකමක් සමාලෝචිත වර්ෂය අවසානයටද ලබාගෙන නොතිබුණි.

**4.3 ව්‍යාපෘති කළමනාකරණය - ඇස්ෆලට් සහ ක්‍රෂර් යන්ත්‍ර වැඩබිම ව්‍යාපෘතිය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ දී රු.මිලියන 372 ආයෝජනයක් සහිතව ස්ථාපනය කරන ලද විශේෂ මෙහෙයුම් අංශයේ ඇස්ෆලට් සහ ක්‍රෂර් යන්ත්‍ර වැඩබිම ව්‍යාපෘතිය කළමනාකරණයේ දී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම, ව්‍යාපෘතියේ අරමුණු, පරමාර්ථ සහ ඉලක්ක නිසි පරිදි හඳුනා නොගැනීම, සුදුසුකම් ලත් සේවක මණ්ඩලයක් නොයෙදවීම, පිරිවැය කළමනාකරණය හා යන්ත්‍ර ආරක්ෂාව, නඩත්තුව සහ සංවර්ධනය පිළිබඳ අවධානය යොමු නොවීම යනාදී කරුණු කෙරෙහි සංස්ථාවේ අවධානය යොමු නොකිරීම නිසා එය සමාලෝචිත වර්ෂය අවසාන වන විට අසාර්ථක වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයන්හි යථෝක්ත වැඩබිමේ අලාභය පිළිවෙලින් රු.මිලියන 0.58 ක් හා රු.මිලියන 4.85 ක් විය.

(ඇ) වැඩබිමේ සවිකර ඇති රු.මිලියන 203 ක් වටිනා ක්‍රෂර් යන්ත්‍රය, ජෙනරේටරය සහ තාර ප්‍රවාහන රථ 2012 ජූලි 18 දින සිට භාවිතයකින් තොරව පැවතුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 ජුනි 16 දින සිට 2012 ජුනි 15 දින දක්වා වූ අවුරුද්දක කාලපරිච්ඡේදයක් සඳහා පමණක් සංස්ථා සේවකයන්ට ජීවිත රක්ෂණාවරන සහ වෛද්‍ය රක්ෂණාවරන ලබාදීම සඳහා 2011 ජුනි 16 දින එකතුව රු. 5,885,178 ක මුදලක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගෙවා තිබුණු නමුත් මෙම රක්ෂණ ආවරණය සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ දී චීනයෙන් ආනයනය කරන ලද ආනයනික වටිනාකම රු.මිලියන 1,339.3 ක්වූ යන්ත්‍රෝපකරණ සමාලෝචිත වර්ෂයේදී වටිනාකම රු.මිලියන 735.6 කට පිළිගත් තක්සේරුකරුවන් විසින් තක්සේරුකර තිබුණි. වත්කම් මිලදීගෙන වර්ෂයක් වැනි කෙටි කාලයක් තුල සියයට 45 කින් අගය අඩුවීම හේතුවෙන් එම වත්කම් වල මුල් වටිනාකමේ සාධාරණත්වය පිළිබඳව විගණනයේදී සෑහිමකට පත්වීමට නොහැකි විය.

**4.5 ආර්ථික නොවූ ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ සිටම විදේශ රටවල ඉදිකිරීම් ව්‍යාපෘති අරඹා ආදායම් ඉපයීමට සංස්ථාව උනන්දු වී තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 13 ක මුදලක් වැයකර තිබුණි. එහෙත් කිසිඳු විදේශ රටක ඉදිකිරීමක් ඇරඹීමට, කොන්ත්‍රාත් ලබා ගැනීමට හෝ කිසිඳු ආදායමක් ඉපයීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සංස්ථාව අපොහොසත්වී තිබුණි.

(ආ) විදේශයන්හි ඉදිකිරීම් ව්‍යාපෘති ඇරඹීම සඳහා පිහිට වූ සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථා (කටාර්) සමාගමේ බැංකු ගනුදෙනු සඳහා දෝහා බැංකු ගිණුමක 2009 වර්ෂයේ තැන්පත් කළ රු. 5,958,715 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ආපසු ලබාගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ඉදිකිරීම් කොන්ත්‍රාත් නියමිත කාලය තුළ අවසන් නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැඩ ප්‍රමාද ගාස්තු ලෙස රු. මිලියන 19.62 ක මුදලක් ගෙවීමට සංස්ථාවට සිදුවී තිබුණි.

(ඈ) දීප ව්‍යාප්ත සිවිල් වැඩ ව්‍යාප්ත කිරීමේ අරමුණින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් ද තොරව අලෙවි ප්‍රවර්ධන නිළධාරින් 49 දෙනෙක් බඳවා ගෙන ඔවුනට සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 16.93 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. එහෙත් මාතලේ, දංකොටුව වැනි ස්ථානවල පිහිටි නිෂ්පාදන වැඩබිම්වල පිරිවැටුම සමාලෝචිත වර්ෂයේදීද වැඩිවී නොතිබුණු අතර ඒවා දිගින් දිගටම අලාභ ලබන තත්ත්වයේම පැවතුණි. තවද සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් ලෙස රු. මිලියන 35.74 ක් දරා තිබුණ ද නව ව්‍යාපෘති කිසිවක් ආරම්භ කර නොතිබුණි.

**4.6 හානි හා පාඩු**

සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා පිරිවැය දැරීම හේතුවෙන් ව්‍යාපෘති 34 ක් වෙනුවෙන් රු.මිලියන 186.96 ක අලාභයක් සිදුවී තිබුණි.

**4.7 කොන්ත්‍රාත් පාලනය**

ඉදිකිරීම් අංශයේ ඉන්වොයිස් ඉදිරිපත් කිරීමේදී දරන ලද පිරිවැයට වඩා ඉතා ඉහළ වටිනාකමක් සහිතව ඉන්වොයිස් පිළියෙල කර සේවායෝජකට ඉදිරිපත් කළ අවස්ථා මෙන්ම දරන ලද පිරිවැයට වඩා ඉතා අඩුවෙන් ඉන්වොයිස් ඉදිරිපත් කළ අවස්ථාද විය. මෙම තත්ත්වය ජංගම වත්කම් සහ ජංගම වගකීම් තුළ ඇතුළත් ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු සහ ගණුදෙනුකරුවන්ට ගෙවිය යුතු වටිනාකම් අසාමාන්‍ය ලෙස අධිගණනය වීමට හේතුවී තිබුණි.

**4.8 සංස්ථාවේ සම්පත් වෙනත් රාජ්‍ය ආයතන වෙත පැවරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදයේ විධානයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් වාහන 36 ක් ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශයට මුදාහැර තිබුණි. වාහන සඳහා ඉන්ධන වියදම් සහ කුලී ගාස්තු ලෙස රු.මිලියන 28.73 ක වියදම් දරා තිබුණු අතර අමාත්‍යාංශයට නිදහස්කල රියදුරන් 21 දෙනෙකුට වැටුප් සහ අතිකාළ දීමනා වශයෙන් රු.මිලියන 8.23 ක් ද ගෙවා තිබුණි.

(ආ) රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍ය සම්බන්ධීකරණ ලේකම්වරුන් තුන්දෙනෙකුට හා රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති ජනසෙවන වැඩසටහනට සම්බන්ධ සේවකයින් පස්දෙනෙකුට

වැටුප් ලෙස පිළිවෙලින් රු. මිලියන 02 ක් හා රු.මිලියන 0.91 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. ඊට අමතරව සංස්ථාවේ සේවකයින් 12 දෙනෙකු රේගීය අමාත්‍යාංශයට මුදාහැර ඔවුන් සඳහා රු .මිලියන 4 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

4.9 **මානව සම්පත් කළමනාකරණය**

කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්යය මණ්ඩලය 2,883 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්යය මණ්ඩලය 3,102 ක් වීමෙන් සේවකයන් 219 ක අතිරික්තයක් නිරීක්ෂණය විය. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 611 ක් පුරප්පාඩුව පැවති අතර අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් සේවක සංඛ්‍යාව 816 ක් සහ අනියම් සේවක සංඛ්‍යාව 14 ක් වීමෙන් සමස්ථ කාර්යය මණ්ඩලය සේවකයන් 219 කින් ඉක්මවා තිබුණි.

(ii) සංස්ථාවේ ඉහළ කළමනාකරණයේ තනතුරු 13 කට අදාළ නිළධාරින් 64 දෙනෙකු 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය වන විටදී ද බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එය සංස්ථාවේ කාර්ය සාධනයට සෘජුව බලපා තිබුණි.

(iii) සංස්ථාවේ ඉහළ කළමනාකරණය නියෝජනයවන තනතුරු 14 ක් සඳහා 2006 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනමින් නිළධාරින් 96 දෙනෙකු බඳවා ගෙන තිබුණු අතර එම නිළධාරින්ගේ සේවක පිරිවැටුම ඉහළ අගයක් ගෙන තිබුණි.

5. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

5.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම දින 285 ක කාල ප්‍රමාදයකින් පසුව 2014 දෙසැම්බර් 10 දින සිදුකර තිබුණි.

5.2 **සංයුක්ත සැලැස්ම**

2007 දෙසැම්බර් 18 දිනැති අංක පීඊඩී 47 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහපාලනය පිළිබඳව මාර්ගෝපදේශ සංග්‍රහයේ 05 පරිච්ඡේදය පරිදි 2012 – 2015 කාල පරිච්ඡේද වෙනුවෙන් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම 2013-2016 කාලපරිච්ඡේදයට අදාළව යාවත්කාලීන කර නොතිබුණි.

5.3 **ක්‍රියාකාරී සැලැස්ම**

(i) 2012-2015 කාලපරිච්ඡේදයට පිළියෙල කරන ලද සංයුක්ත සැලැසුම තුළ ඇතුළත් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලසුම තුළ අන්තර්ගත සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් ඉටුකල යුතු ක්‍රියාකාරකම් 08 ක් ඉටුකර ගැනීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි.

(ii) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරකම්වලට අදාලව එක් එක් කාර්යභාර නිළධාරින් ලඟාකර ගතයුතු ඉලක්කයන් සහ ක්‍රියාකාරකම් දක්වා තිබුණද, අදාල ඉලක්කයන් ප්‍රමාණාත්මක වටිනාකම් ලෙස දක්වා නොතිබුණි.

5.4 **අයවැය ලේඛනමය පාලනය**

---------------------------------

අයවැයගත සහ තථ්‍ය ආදායම්, වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

.

5.5 **වාර්ෂික වාර්තා**

---------------

සංස්ථාව විසින් 2012 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2015 අප්‍රේල් 08 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) කොන්ත්‍රාත් පාලනය
(ආ) අත්තිකාරම් පාලනය
(ඇ) ඉන්වෙන්ට්‍රි පාලනය
(ඈ) ගිණුම්කරණය
(ඉ) මානව සම්පත් කළමනාකරණය
(ඊ) බදු කළමනාකරණය
(උ) ප්‍රසම්පදාන ක්‍රියාවලිය